# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 47 දරන
# (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක

මිල : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 47 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 81/78.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 47 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ පනතෙහි 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය පරිච්ඡින්න කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) නගර සභා ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:—

"(3) නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ විශේෂ කොමසාරිස් වරයකු පත් කිරීමෙන් පසු යම් අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්—

(අ) නගර සභාවේ සභාපතිවරයා, උපසභාපතිවරයා සහ සෙසු සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා පළමුවන මහා ඡන්ද විමසීම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව පැවැත්විය යුතු බවට විධාන කරනු ලැබිය හැකිය; තව ද

(ආ) එකී පළමුවන මහා ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයාගේ, උපසභාපතිවර යාගේ සහ සෙසු සභිකයන්ගේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා විසින් ධුරය දරනු ලැබීම සහ නගර සභාවේ කටයුතු පරිපාලනය කරනු ලැබීම, නගර සභාවේ සභාපතිවරයාගේ, උපසභාපතිවරයාගේ සහ සෙසු සභිකයන්ගේ ධුර කාලය ආරම්භ වන දිනයෙහි, අවසාන

විය යුතු අතර, ඒ විශේෂ කොමසාරිස්වරයා වෙත සතු වී තිබෙන්නේ යයි සලකනු ලබන, නගර සභාවේ සියලු දේපළ සහ ගිවිසුම් යටතේ වූ අයිතිවාසිකම් සහ නගර සභාවේ සියලු බලතල සහ (2) වන උපවගන්තිය යටතේ ඒ විශේෂ කොමසාරිස්වරයා වෙත පවරනු ලැබූ, නගර සභාවේ සියලු කාර්ය සහ වගකීම් නගර සභාව වෙත සතු කොට, පවරනු ලැබිය යුතු අතර නගර සභාව විසින් ඒවා ඉටු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය පරිච්ඡින්න කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ගම් සභා ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, ගම් සභාවේ කටයුතු පරිපාලනය කිරීමට පරිපාලකවරයකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(3) ගම් සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ පරිපාලකවරයකු පත් කිරීමෙන් පසු යම් අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්—

(අ) ඒ ගම් සභාවේ සභාපතිවරයා, උපසභාපතිවරයා සහ සෙසු සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා පළමුවන ඡන්ද විමසීම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව පැවැත්විය යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය; තව ද

(ආ) එකී පළමුවන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු ලබන එක් එක් සභිකයාගේ ධූර කාලය ආරම්භ විය යුතු දිනය නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ පරිපාලකවරයා විසින් ධූරය දරනු ලැබීම සහ ගම් සභාවේ කටයුතු පරිපාලනය කරනු ලැබීම, ගම් සභාවේ සභාපතිවරයාගේ, උපසභාපතිවරයාගේ සහ සෙසු සභිකයන්ගේ ධූර කාලය ආරම්භ වන දිනයෙහි අවසාන විය යුතු අතර, ඒ පරිපාලකවරයා වෙත සතු වී තිබෙන්නේ යයි සලකනු ලබන, ගම් සභාවේ සියලු දේපළ සහ ගිවිසුම් යටතේ වූ අයිතිවාසිකම් සහ ගම් සභාවේ සියලු බලතල සහ (2) වන උපවගන්තිය යටතේ ඒ පරිපාලකවරයා වෙත පවරනු ලැබූ, ගම් සභාවේ සියලු කාර්ය සහ වගකීම් ගම් සභාව වෙත සතු කොට, පවරනු ලැබිය යුතු අතර ගම් සභාව විසින් ඒවා ඉටු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදය පරිච්ඡින්න කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

'(අ) පහත සඳහන් දේපළ, එනම් :—

(අ) නගර සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සන්තකයෙහි හෝ භාරයෙහි පැවති යම් දේපළක් ; සහ

(ආ) නගර සභාවේ පරිපාලන සීමාවලින් පිටත පිහිටි සහ මණ්ඩලයට අයත් විදුලි බලාගාරය,

හැර—

(i) (මෙහි මින් මතු "මණ්ඩල පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතේ 34 වන වගන්තියෙන් මණ්ඩලය වෙත සතු කරනු ලැබූ ;

(ii) මණ්ඩල පනතේ 15 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය සඳහා අත්කර ගනු ලැබූ ;

(iii) මණ්ඩල පනතේ 17 වන වගන්තිය මගින් මණ්ඩලය වෙත සතු කරනු ලැබූ ;

(iv) මණ්ඩලය විසින් මිලට ගනු ලැබූ ; සහ

(v) කලින් තිබුණු අනුරාධපුර නගර සභාව විසුරුවා හැරීමෙන් පසු, විශේෂ කොමසාරිස්වරයා විසින් අත්කර ගනු ලැබූ හෝ මිලට ගනු ලැබූ

සියලු නිශ්චල දේපළ පිහිටා තිබෙන්නේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනය වෙත ඒ සියලු නිශ්චල දේපළ මෙයින් පවරා සතු කරනු ලැබේ ; තව ද, යම් කොන්දේසිවලට යටත්ව මණ්ඩලය වෙත සතු කරනු ලැබූ, රජයේ නිශ්චල දේපළ වූ එවැනි යම් දේපළක් ඒ කොන්දේසිවලට යටත්ව ඒ පළාත් පාලන ආයතනය විසින් දැරිය යුතු ය ;' ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "මේ වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් බද්දක් සම්බන්ධයෙන් නොවන" යන වචන අත් හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පළාත් පාලන ආයතනයක් වෙත සතු කරනු ලැබූ වෙනත්

6. නගර සභාව සංස්ථාපනය කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි—

(අ) ස්වකීය කාර්ය අතුරින් කිසිවක් සඳහා මණ්ඩලය විසින් පාවිච්චි කරනු ලැබූ, ගොඩනැගිලි සහිත හෝ රහිත, සියලු රජයේ ඉඩම් ; සහ

(ආ) ආණ්ඩුව විසින් ඉදි කරනු ලැබූ නමුත් මණ්ඩලය විසින් පරිපාලනය කරනු ලැබූ සියලු සාප්පු, වෙළෙඳ සැල් සහ නිවාස

ඒ දේපළ පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනය වෙත එසේ නගර සභාව සංස්ථාපනය කරන ලද දින සිට, සතු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) (මේ පනත යටතේ පළාත් පාලන ආයතනය වෙත සතු කරනු ලැබූ ගොඩනැගිලි සහිත හෝ රහිත රජයේ ඉඩම් බදු දීමක් හෝ අන්සතු කිරීමක් නොවන) මණ්ඩලය විසින් කරනු ලැබූ, මණ්ඩලයේ බල ප්‍රදේශය ඇතුළත වූ ගොඩනැගිලි සහිත හෝ රහිත, රජයේ සෑම ඉඩම් බදුදීමක් හෝ අන්සතු කිරීමක්, ඒ ඉඩම් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති වරයා විසින් දෙනු ලැබූ බද්දක් හෝ කරනු ලැබූ අන්සතු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු දීමට හෝ අන්සතු කිරීමට, දිසාපතිවරයා පාර්ශ්වකරුවකු වූවාක් මෙන්, ඒ බදු දීම හෝ අන්සතු කිරීම සම්පූර්ණ වශයෙන් සහ කාර්ය සාධක ලෙස, බලාත්මක කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ "අතුරු ව්‍යවස්ථාව" යන්නෙහි අර්ථ කථන යට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"අන්සතු කිරීම" යන්නට—

(1) යම් සමර්පනයක්, පැවරීමක්, ප්‍රදානය කිරීමක් හෝ වෙනත් කවර හෝ බැහැර කිරීමක් ; සහ

(2) අරමුණු කරනු ලැබූ හෝ යෝජිත හෝ අභිප්‍රේත සමර්පනයක්, පැවරීමක්, ප්‍රදානය කිරීමක් හෝ වෙනත් කවර හෝ බැහැර කිරීමක් යටතේ සන්තකය පැවරීම

ඇතුළත් වේ.'.

(2) ඒ වගන්තියේ "තිසි ප්‍රඥප්තිය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"කලින් තිබුණු අනුරාධපුර නගර සභාව" යන්නෙන්, නගර සභා ආඥාපනත යටතේ අනුරාධපුර නගරය සඳහා සංස්ථාපනය කරනු ලැබ, තදනන්තරව ඒ ආඥාපනතේ 184 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සහ පළ කරනු ලැබූ නියමයකින් විසුරුවා හරිනු ලැබූ නගර සභාව අදහස් වේ.'.

පළාත් පාලන ආයතනය වෙත කලින් සතු කොට තිබුණු ඇතැම් දේපළ රජය වෙත සතු කළ යුතු බව.

8. මේ පනතේ 5 වන වගන්තියෙන් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙන්, යම් පළාත් පාලන ආයතනයක් වෙත සතු කර තිබෙන ලෙස සලකනු ලබන සියලු දේපළ හැර, ඒ පළාත් පාලන ආයතනය වෙත සතු කරනු ලැබ තිබෙන සහ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමා ඇතුළත පිහිටි, පහත දැක්වෙන වර්ග වලට අයත් සියලු දේපළ, එනම් :—

(අ) මුඩු බිම් සහ එළිමහන් ස්ථාන ;

(ආ) ගල්, කබොක් සහ බොරලු වලවල් ;

(ඇ) පොදු වැව් සහ ගඟුලු ;

(ඈ) පොදු තටාක, පොකුණු සහ දිය අගල් ;

(ඉ) ගොඩනැගිලි සහිත හෝ රහිත, රජයේ ඉඩම් ; සහ

(ඊ) පොදු උද්‍යාන හා වතු සහ ඒවා තුළ පිහිටි සියලු ඉදිකිරීම් සහ ගොඩනැගිලි

මෙයින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට රජය වෙත සතු කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි කොළඹ 1 තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයිමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.